# උත්ථාන සමයේ තෙවන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය ක්‍රියා 2: 14, 22–33

*අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් උපුටා ගත් කොටසකි.*

දෙවියන් වහන්සේ මරණ බන්ධනයෙන්
ජේසුස් වහන්සේ මුදා උත්ථාන කර වදාළ සේක.

එවිට එකොළොස් දෙනා සමඟ නැඟී සිටි පේදුරු තුමා ශබ්ද නගා ඔවුන්ට මෙසේ කී ය. "ජුදෙව් ජනයෙනි, ජෙරුසලමේ වසන සියල්ලෙනි, මෙය දැනගන්න: මාගේ වචනවලට සාවධාන ව සවන් දෙන්න. ඉශ්රායෙල් ජනයෙනි, මේ වචනයට සවන් දෙන්න. ඔබ ම දන්නා ලෙස, නාසරෙත්හි ජේසුස් වහන්සේ, දෙවියන් වහන්සේ විසින් තෝරා පත් කළ මනුෂ්‍යයෙකි. ඒ බව, දෙවියන් වහන්සේ උන් වහන්සේ මගින් ඔබ අතර කළ ප්‍රබල ක්‍රියාවලින් ද අරුම පුදුම දේ වලින් ද ලකුණු වලින් ද පෙන්වූ සේක. එම ජේසුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ නියමිත අභිප්‍රාය හා පෙර දැනුම අනුව, පාවා දෙනු ලැබූ සේක. ඔබ අදමිටු මිනිසුන් ලවා උන් වහන්සේ කුරුසියේ ඇණ ගස්වා මරා දැමුවහු ය. එහෙත් දෙවියන් වහන්සේ මරණ බන්ධනයෙන් උන් වහන්සේ මුදා උත්ථාන කර වදාළ සේක. මන්ද, මරණයට උන් වහන්සේ බැඳ තබාගත නොහැකි විය. දාවිත් උන් වහන්සේ ගැන කතා කරමින් මෙසේ කී ය: 'සමිඳාණන් වහන්සේ නිරතුරු මා ඉදිරියේ සිටිනු දුටිමි. මා නොසැලෙන පිණිස උන් වහන්සේ මාගේ දකුණු පසෙහි සිටින සේක. එබැවින් මාගේ හද සොම්නස් විය: මාගේ වචන ප්‍රමුදිත විය: මාගේ සිරුර ද බලාපොරොත්තුවෙන් පුල පුලා සිටින්නේ ය. මන්ද, ඔබ වහන්සේ, මාගේ ජීවිතය පාතාලයේ දමන්නේ වත්, ඔබගේ දැහැමි තැනැත්තා ජරාපත් වන්නට ඉඩ දෙන්නේ වත් නැත. ඔබ ජීවනයේ මාර්ගයෙන් මට දැන් වූ සේක. ඔබගේ වැඩ විසීමෙන් ඔබ මා ප්‍රීතියෙන් පුරවන සේක.'

සහෝදරවරුනි, ආදි පිතෘ වන දාවිත් මළ බවත්, තැන්පත් කරනු ලැබූ බවත් නොවළහා කියන්නට කැමැත්තෙමි. ඔහුගේ සොහොන අද දක්වා අප අතර ඇත. ඔහු දිවැසිවරයෙකු වූ බැවින්, ඔහුගේ වංශයෙන් කෙනෙකු ඔහුගේ සිංහාසනය පිට හිඳුවන සේකැ යි දෙවියන් වහන්සේ දිවුරුමකින් ඔහුට දිවුළ බව ඔහු දැනගත්තේ ය.

ඔහු මෙය කල්මත්තෙන් දැක, ක්‍රිස්තුන් වහන්සේගේ පුනරුප්පත්තිය ගැන කතා කරමින්, 'උන් වහන්සේ පාතාලයේ හැරදමනු නොලැබූ බවත්, උන් වහන්සේගේ සිරුර ජරාපත් නොවූ බවත්' කී ය. දෙවියන් වහන්සේ මෙම ජේසුස් වහන්සේ මරණයෙන් උත්ථාන කොට වදාළ සේක. එයට අපි සියල්ලෝ සාක්ෂිකාරයෝ වෙමු. උන් වහන්සේ දෙවියන් වහන්සේගේ දකුණතින් උසස් කරනු ලැබ, පියාණන් වහන්සේ පොරොන්දු වූ ශුද්ධාත්මයාණන් ලබා, ඔබ අසන දකින මේ දේ ප්‍රදානය කළ සේක."

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 16:1–2, 5, 7–11

පිළිතුර: සමිඳුනි, ඔබ වහන්සේ මට ජීවන මග හෙළිකරන සේක.
ආලේලූයා! ආලේලූයා!

ගීය : දෙවිඳුනි, මම ඔබ සරණ කොට ගතිමි.
එබැවින් මා රැකගත මැනව.
මම මෙසේ කීමි: "සමිඳුනි, ඔබ මාගේ සමිඳාණන් වහන්සේ ය,
මාගේ සව් සම්පත ය.
ඔබ හැර අන්කිසි සෙතක් මට නැත්තේ ය."

සමිඳුනි, මාගේ උරුමය හා ඉරණම ඔබ වහන්සේ ය.
ඔබ, ඔබ පමණක් ම මා උරුම කොටස රක්නා සේක.
මට උවදෙස් දෙන හිමි තුමන් හට තුති කරන්නෙමි.
රෑ යාම්වල දී මා සිත් සතන්හි නුවණ පහළ වන්නේ ය.

හිමිතුමන් නිරතුරු මා අබියස තබාගන්නෙමි.
මා දකුණු පස එතුමාණන් වැඩ වසන බැවින් මම නොසැලෙන්නෙමි.
එබැවින් මසිත උදන් අනයි:
මහද ප්‍රීතියෙන් පිනා යන්නේ ය: මා ගත සුරැකි ව ඇත්තේ ය.

මන්ද, ඔබ මා පාතාලයෙහි නොරඳවන සේක:
ඔබේ දැහැමි තැනැත්තාට ජරාපත් වීමට ඉඩ නොදෙන සේක.
ඔබ මට ජීවන මග හෙළි කරන සේක.
ඔබ අබිමුවෙහි පිරිපුන් සතුට මට වන්නේ ය.
ඔබ දකුණුපස සැප සම්පත් සදහට ම ඇත්තේ ය.

## දෙවන දේව ප්‍රකාශනය 1 පේදුරු 1: 17–21

*ශුද්ධ වූ පේදුරු තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"නිකැළැල් අජබාලකයාණන් වන
ක්‍රිස්තුස් වහන්සේගේ ලෙයින් ඔබ මුදනු ලැබුවහු ය."

තවද, මනුෂ්‍යයන්ගේ තරාතිරම් නොබලා, එකිනෙකාගේ ක්‍රියා අනුව විනිශ්වය කරන තැනැත් වහන්සේට 'පියාණෙනි' ය කියා ඔබ යාච්ඤා කරන්නහු නම්, මිහි පිට ඔබ විදේශී ව සිටින කාලය දේව ගරුබියෙන් ගත කරන්න. ඔබගේ පියවරුන්ගෙන් ලැබූ නිෂ්ඵල ජීවිත මාර්ගයෙන් ඔබ මුදනු ලැබුවේ රන් රිදී වැනි දිරායන දේවල් මගින් නොව, කැළැලක් වත් පලුද්දක් වත් නැති බැටළු පැටවකුගේ ලේ වැනි ක්‍රිස්තුන් වහන්සේගේ අගනා ලෙය කරණකොටගෙන බව ඔබ දන්නහු ය. මේ මිදීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ, ලෝකය මැවීමට පෙර තෝරාගනු ලැබ, ඔබ උදෙසා මේ අන්තිම කාලයේ දී ප්‍රකාශ කරනු ලැබූ සේක. ඔබ මෙම ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන, උන් වහන්සේ මරණයෙන් උත්ථාන කොට මහිමයට පත්කළ දෙවියන් වහන්සේ අදහන්නහු ය. මෙලෙස දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ල ද බලාපොරොත්තුව ද ඔබට ඇත.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද ලූක් 24: 32

ආලේලූයා! ආලේලූයා!
ජේසු සමිඳුනි, ශුද්ධ ලියවිල්ල අපට පහදා දුන මැනව,
ඔබ අප හා සමඟ කතාකරන විට අපේ හදවත්
දැවී ඇවිළී යන්නට සලසනු මැනව.
ආලේලූයා!

## සුවිශේෂය ලූක් 24: 13–35

*සුවිශේෂක ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### පූජය කඩා ආශිර්වාද කරන විට
### ශ්‍රාවකයෝ උත්ථාන වූ සමිඳාණන් හඳුනාගත්හ.

එම දවසෙහි ශ්‍රාවකයන්ගෙන් දෙදෙනෙක් ජෙරුසලමෙහි සිට කිලෝමීටර් එකොළහක් පමණ දුර වූ එම්මාවුස් නම් ගමට යමින් සිටියහ. එසේ යද්දී, ඔව්හු සිදුවූ සියල්ල ගැන කතාකරමින් ගියහ. තවද, ඔවුන් සාකච්ඡා කරමින් යද්දී, ජේසුස් වහන්සේ ම ඔවුන් සමීපයට වැඩ, ඔවුන් හා සමග ගමන් ගත් සේක. ඔවුන් උන් වහන්සේ දුටු නමුත් ඔවුන්ට උන් වහන්සේ හඳුනා ගත නොහැකි විය. උන් වහන්සේ ඔවුන්ට කතා කොට, "මේ ඔබ තර්ක කරමින් යන්නේ කුමන කාරණා ගැන දැ"යි ඇසූ සේක. ඔව්හු දුක්මුසු මුහුණින් යුක්ත ව නතර වූ හ. ඔවුන්ගෙන් ක්ලේයෝපස් නම් තැනැත්තා උත්තර දෙමින්, "මේ දවස්වල ජෙරුසලමෙහි සිදුවූ කාරණා නොදැන සිටින අමුත්තා ඔබ පමණක් දැ" යි උන් වහන්සේට කී ය. "කවර කාරණා දැ"යි උන් වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. ඔව්හු උත්තර දෙමින්, "නාසරෙත්හි ජේසුස් වහන්සේ පිළිබඳ කාරණා ය. උන් වහන්සේ දෙවියන් වහන්සේ හා සකල ජනතාව ඉදිරියෙහි ක්‍රියාවෙහි ද කතාවෙහි ද බලසම්පන්න දිවැසිවරයෙකු ව සිටි සේක. නායක පූජකවරු ද අපගේ ප්‍රධානීහු ද උන් වහන්සේ මරණයට නියම කොට කුරුසියෙහි ඇණ ගැසූ හ. එහෙත් ඉශ්රායෙල් මුදාලීමට සිටි එකම තැනැත් වහන්සේ උන් වහන්සේ ය යනු අපගේ බලාපොරොත්තුව විය. එපමණක් නොවේ. මේ දේ සිදු වී අදට තුන් දවසක් ගතවී ඇත. තවද, අපේ කණ්ඩායමේ ඇතැම් ස්ත්‍රීහු අද හිමිදිරි උදයේ සොහොන් ගෙය ළඟට ගොස් උන් වහන්සේගේ සිරුර නොදැක අවුත් ඔවුන්ට දර්ශනය වූ දේව දූතයන් 'උන් වහන්සේ ජීවමානව සිටින සේකැ' යි පැවසූ බව කියා අප විස්මිත කළහ. අප හා සමග සිටි අයගෙන් සමහරෙක් සොහොන් ගෙය ළඟට ගොස් ඒ ස්ත්‍රීන් කී ලෙස ම දුටුවෝ ය. එහෙත්, ඔව්හු උන් වහන්සේ නුදුටුවෝ ය"යි කී හ. එවිට උන් වහන්සේ ඔවුන් අමතා, "බුද්ධිහීන වූ ද දිවැසිවරයන් පැවසූ සියල්ල විශ්වාස කිරීමට මැලි වූ ද තැනැත්තෙනි, ක්‍රිස්තුන් වහන්සේ ඒ දුක් විඳ ඉක්බිති ස්වකීය තේජශ්‍රීයට පැමිණිය යුතු ව තිබුණා නොවේ ද" කියා, මෝසෙස් හා සියලු දිවැසිවරයන්ගෙන් පටන්ගෙන, මුළු ශුද්ධ ලියවිල්ලෙහි තමන් ගැන සඳහන් කරුණු ඔවුන්ට පහදා දුන් සේක. ඔව්හු යමින්

සිටි ගමට ළං වූ හ. එහෙත් උන් වහන්සේ තවත් දුර යන බවක් දැක්වූ සේක. එවිට ඔව්හු "දවස ගෙවී සවස් වෙයගෙන එන බැවින්, අප සමග නතර වුව මැනැවැ" යි උන් වහන්සේට පෙරැත්ත කළහ. උන් වහන්සේ ඔවුන් සමග නතරවීමට ගෙට ඇතුළු වූ සේක. තවද උන් වහන්සේ ඔවුන් හා සමග කෑමට හිඳගත් කල්හි, රොටි ගෙන ආශිර්වාදය පවසා, කඩා ඔවුන්ට දුන් සේක. එවිට ඔවුන්ගේ ඇස් ඇරී, ඔව්හු උන් වහන්සේ කවරෙක් දැ යි හැඳින ගත්හ. එවිට උන් වහන්සේ ඔවුන් කෙරෙන් අතුරුදහන් වූ සේක. එකල ඔව්හු, "උන් වහන්සේ අප හා සමග මග දී කතා කරද්දීත්, ශුද්ධ ලියවිල්ල පහදා දෙද්දීත්, අපේ හදවත දැවී ඇවිලී ගියා නොවේ දැ"යි එකිනෙකාට කී හ. ඔව්හු ඒ වෙලේ ම නැගිට ජෙරුසලමට පෙරළා ගොස් එකොළොස් දෙනා ද ඔවුන් සමග සිටි අනෙක් අය ද, "ඒකාන්තයෙන් ම සමිඳාණන් වහන්සේ නැගිට සිටින සේක, සීමොන්ට ද පෙණුනු සේකැ"යි කියමින් සිටිනු දුටහ. එවිට ඔව්හු ද මග දී තමන්ට සිදු වූ කාරණා සහ රොටි කැඩීමෙහි දී ඔවුන්ට උන් වහන්සේ ප්‍රකාශ වූ හැටි ද පැවසූ හ.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*